# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1987 අංක 44 දරන ලංකා කලා මණ්ඩල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 නොවැම්බර් මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 නොවැම්බර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 45 යි.

තැපැල් ගාස්තුව : ශත 75 යි.

1987 අංක 44 දරන ලංකා කලා මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 නොවැම්බර් මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 57/84

ලංකා කලා මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1987 අංක 44 දරන ලංකා කලා මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා කලා මණ්ඩල පනතේ 7 වන වගන්තියේ (අ) ඡේදයේ "අධ්‍යාපන අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින්" යන වචන වෙනුවට "අමාත්‍යවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 278 වන අධිකාරයේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (අ) ඡේදයෙහි "අධ්‍යාපන අමාත්‍යවරයාගේ අදහස් විමසා අමාත්‍යවරයා, විසින්" යන වචන වෙනුවට, "අමාත්‍යවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "(5අ.) මේ පනතේ 7 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් සාමාජිකයකුට මණ්ඩලයේ යම් රැස්වීමකට සහභාගිවීමට නොහැකිවන අවස්ථා වක, ඔහු විසින්—
>
> (අ) තමා සභාපතිවරයා වන මූල මණ්ඩලයේ යම් සාමාජිකයකු එම රැස්වීමට පැමිණ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා නම් කරනු ලැබිය හැකි ය; තවද
>
> (ආ) එම නම් කිරීම මණ්ඩලයේ සභාපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි "අමාත්‍යවරයාගේ හා අධ්‍යාපන අමාත්‍යවරයාගේ" යන වචන වෙනුවට, "අමාත්‍යවරයාගේ" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

2—ඒ 098511—7,210(87/07)

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" මණ්ඩලයේ අරමුදල.

14. (1) මණ්ඩලයට එය සතු අරමුදලක් තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ අරමුදලට—

(අ) මණ්ඩලයේ පරිහරණය සඳහා ප්‍රදානයක හෝ ණයක මාර්ගයෙන් පාර්ලිමේන්තුව විසින් කලින් කල වෙන් කරනු ලැබිය හැකි සියලුම මුදල් ;

(ආ) මණ්ඩලයේ බලතල ක්‍රියාවේ යෙදවීමේ දී මණ්ඩලය විසින් ලබා ගන්නා සියලුම මුදල් ;

(ඇ) දේශීය හා විදේශීය මාර්ගවලින් ත්‍යාග වශයෙන් ලැබෙන සියලුම මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ බලතල ක්‍රියාවේ යෙදවීමේ දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් ගෙවීම සඳහා අවශ්‍ය සියලුම මුදල් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :—

" මණ්ඩලයේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

15. (1) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලයේ ආදායම සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලුම ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට මණ්ඩලය විසින් සලස්වනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ කරනු ලැබිය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.